දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832 Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ..................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.

'இசுருபாயா'
பத்தரமுல்ல.

"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. } ED/3/45/JIY-2010

දිනය / திகதி / Date } 2010.02.08

සියලුම විදුහල්පතිවරුන් වෙත

**<u>ජාත්‍යන්තර විද්‍යා හා ඉංජිනේරු තරගය - 2010</u>**
**<u>ශ්‍රී ලංකා වසරේ කණිෂ්ඨ නිර්මාණකරු තේරීමේ තරගාවලිය</u>**

සිසුන්ගේ විද්‍යා හා තාක්ෂණ නිර්මාණශීලි හැකියාවන් ඉස්මතු කර ගැනීමේ පරමාර්ථයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ පූර්ණ සහාය සමග ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් 2010 වර්ෂය සඳහා ද "වසරේ කණිෂ්ඨ නිර්මාණකරු තේරීමේ තරගය" (JIY - 2010) පැවැත්වීමට කටයුතු සම්පාදනය කර ඇත.

ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් සඳහා පදක්කම්, මුදල් ත්‍යාග සහ වටිනා සහතික මෙන්ම, සිසුන් 05 දෙනෙකු සඳහා විශ්ව විද්‍යාල අධ්‍යාපනය අවසන්වන තාක් ආවරණය වන අයුරු අධ්‍යාපනික ශිෂ්‍යත්ව ද ප්‍රදානය කිරීමට යෝජිත අතර, සියලුම තරගකරුවන් සඳහා සහභාගීත්ව සහතිකයක් ද ප්‍රදානය කරනු ඇත. ජයග්‍රාහී සිසු දරු දැරියන් නියෝජනය කරනු ලබන පාසල් සඳහා ද විශේෂ ත්‍යාග හා ඇගයීම් සිදුකිරීමට ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට අනුබද්ධ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය සමග වැඩසටහනක් සම්පාදනය කර ඇත.

මෙම තරගාවලියේ හොඳම කණිෂ්ඨ නිර්මාණකරුවන්ට 2011 වර්ෂයේ ජාත්‍යන්තර විද්‍යා හා ඉංජිනේරු තරගය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීමේ වරම ද හිමි කර දීමට අවශ්‍ය පසුබිම සකස් කර ඇත.

මෙම තරගාවලිය පිළිබඳ සියලු විස්තර හා අයදුම්පත් www.schoolnet.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ද ලබා ගත හැක.

අප දැයේ අනාගත සංවර්ධනය උදෙසා අත්‍යවශ්‍ය නිර්මාණශීලි පුරවැසියන් දැයට හඳුන්වා දීම සඳහා සංවර්ධනය කෙරෙන මෙම "වසරේ කණිෂ්ඨ නිර්මාණකරු තේරීමේ තරගය - 2010" (JIY - 2010) සාර්ථක කර ගැනීම උදෙසා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය වෙත අවශ්‍ය සියලුම සහායන් ලබා දෙන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

**එම්.එම්.එන්.ඩී. බණ්ඩාර**
අධ්‍යාපන ලේකම්

පිටපත් :- 1. පළාත් අධ්‍යාපන ලේකම්වරුන් - කාරුණික දැන ගැනීම සඳහා